# මම තෝරාගත්ත දේශපාලනයක් තියනවා

## අනුර ශ්‍රීනාත්

**අනුර ශ්‍රීනාත්**

*චිත්‍රකතා කලාවට නව මානයක් එක් කළ චිත්‍ර ශිල්පියෙකු ලෙස අනුර ශ්‍රීනාත් හඳුන්වා දිය හැකිය. දශක තුනකට වැඩි ඔහුගේ නිර්මාණකරන ජීවිතය තුළ ඔහු පින්සලෙන් දක්වන ලද දස්කම් බොහෝය. අගනුවර ආශ්‍රිතව ඔහුගේ නිර්මාණ ප්‍රදර්ශණය ''අනුරාලෝකය'' පැවැත්වුණු පසුගිය දිනෙක ''සන්නස'' ඔහු හා කළ පිළිසඳර කතා බහක් මෙසේ පළ කරන්නෙමු. මේ සංලාපයට තිසර තුළු ඔස්සේ ඔබට සජීවීව සවන් යොමු කළ හැකිය. 0094 777 305 798 දුරකථන අංකයෙන් ඔබට අනුර ඇමතිය හැකිය.*

**නිර්මාණකරුවන් සමඟ සාකච්ඡා කරන කොට හුඟක් වෙලාවට මුලින්ම අහන ප්‍රශ්ණයකින් මේ කතාබහත් ආරම්භ කරන්න මම කැමතියි. ඔබගේ ළමා කාලය, පාසල් කාලය මොනවගේද?**
මම ඉපදුනේ කිරුළපොන. ඉස්කෝලේ ගියේ ලුම්බිණි මහා විද්‍යාලයට. ඒ කාලේ හැම කෙනෙකුටම වගේ තිබුණේ කටුක ජීවිත. අපිටත් එහෙමයි. මම හෝඩියේ ඉදළම ඉගෙන ගත්තේ ලුම්බිණි මහා විද්‍යාලයේ. ලුම්බිණිය කියන්නේ සුන්දර තැනක්. ලුම්බිණි රංග ශාලාවේ බොහෝ කලා කටයුතු සිද්ධ වෙනවා. ඒ පරිසරයේ පාසල් අධ්‍යාපනය ලබන කොට බොහෝ කලාත්මක හැඟීම් මට ආවා. ලුම්බිණි රඟහලේ පෙන්නපු නාට්‍ය බැලුවා. නැතිකමටත් වඩා කොලුකමට හොරෙන් තමයි ගොඩක් බැලුවේ. ලයනල් අල්ගම මහත්තයා අපේ ඉස්කෝලේ සංගීතය ඉගැන්නුවා. මමත් සංගීතය කළා. සරත් දසනායක මහත්තයාගේ නෝනා ප්‍රීති දසනායක මහත්මියගෙන් මම බටනලාව ඉගෙන ගෙන ඉස්කෝලේ බෑන්ඩ් එකෙත් බටනලා වාදනය කළා. හිංබබා මාස්ටර්ගෙන් නැටුම් ඉගෙන ගත්තා. ඔය විදිහට මාව කලාවට නැඹුරු වෙන්න පාසල් පරිසරය ගොඩක් බලපෑවා.

**ඒත් ඔබ ඉදිරියට ආවේ ඔය කියුව එකම කලා ක්ෂේත්‍රයකින්වත් නෙවෙයි?**
මම චිත්‍ර ශිල්පයට යොමුවෙන්න මගේ තාත්ත මූලිකව බලපෑමක් වුණා. තාත්තා වැල්ලවත්ත රෙදි මෝලේ කම්කරු රක්ෂාවක් තමයි කළේ. නමුත් තාත්තා දක්ෂ චිත්‍ර ශිල්පියෙක්. වෙසක් පොසොන් වගේ ආගමික උත්සව කාලයට ඔහු වෙසක් කූඩු කැටයම් කිරීම වගේ දේවල් කළා. තොරණ්වල චිත්‍ර ඇන්දා. මමත් ඒවට තිබුණ ආශාව නිසා ටික ටික ඒවට හුරුවුණා. ඒත් තාත්තා කැමති වුණේ නෑ මම චිත්‍ර ශිල්පයට යොමුවෙනවට. නමුත් පාසල් කාලෙදිම මට චිත්‍ර කතා නිර්මාණයට අවස්ථාවක් ලැබීමත්, ඒ මගින් යම් මුදලක් උපයාගන්න අවස්ථාවත් ලැබීමත් නිසා මම ඒ ක්ෂේත්‍රයට යොමු වුණා. තාත්තගේ ජානමය උරුමයක් විදිහට මට තිබුණ චිත්‍ර ඇදීමේ හැකියාවත්, දක්ෂතාවයත් ඒ ක්ෂේත්‍රයේ සාර්ථක ගමනකට හේතුවුණා කියලා මට හිතෙනවා.

**තාත්තගේ බලාපොරොත්තුව වුණේ ඔබ මොන වගේ ක්ෂේත්‍රයකට යොමු කරන්නද?**
තාත්තට ඕනේ වුණේ විද්‍යා අංශයෙන් මාව ඉස-ස්සරහට යවන්න. නැත්නම් හමුදා නිලධාරියෙක් කරන්න. ඒ නිසා පාසලේදී කලා අංශය තෝරාගැනීම තාත්තා තහනම් කළා. විද්‍යාව ඉගෙන ගන්න කිව්වා. මම විද්‍යාව ඉගෙන ගෙන සත්ත්ව විද්‍යාව, භෞතික විද්‍යාව විෂයයන් හොඳින් පාස් වුණා. හමුදාවට යැවීමේ වුවමනාවක් තාත්තට වගේම හමුදාවට බැදීමේ ආශාවක් මටත් තිබුණා. මම ඒ කාලේ කැඩට්න් කළා. දියතලාවේ පුහුණුවීම්වලට දෙපාරක් ගියා. කෝප්‍රල් කෙනෙක් වුණා. නමුත් ඔය කාලේම මම චිත්‍ර ශිල්පයට යොමුවෙලා ඉක්මනින්ම ඒකේ සාර්ථකත්වයට පත්වුණා.

**චිත්‍ර ශිල්පියෙක්වීමේ හැරවුම් ලක්ෂ්‍යය කොතනද?**
තාත්තගෙන් ලැබුණ ආභාෂයෙන් මට චිත්‍ර ඇදීමේ යම් හැකියාවක් තිබුණා කියලා මම කලිනුත් කිව්වා. ඒ හැකියාව නිසාම ඉස්කෝලේ හැම උත්සව අවස්ථාවකදීම විදුහල්පතිතුමා සහ ගුරුවරු විවිධ චිත්‍ර ඇඳීම් පැවරුවේ මට. ඔහොම ඉන්න අතරේ ඒ කාලේ රටේ තදට තිබුණ චිත්‍රකතා පිස්සුව මටත් හැදුණා. ඔය කියන්නේ හැත්තෑගනන්වල අග භාගයේ. ඔය කාලෙදි මට අහම්බෙන් හමුවුණා පී.ඒ. ලීලාරත්න කියන චිත්‍ර ශිල්පියා. ඒ කාලේ ''ස්පාටකස්'', ''සුරේකා'' වගේ ජනප්‍රිය චිත්‍ර කතා ඇන්දේ එයා. ඔහු හමුවීම මට විශාල ආශ්වාදයක් වුණා. ඔහු චිත්‍රකතා අඳින හැටි බලං ඉන්න මට ඉඩ දුන්නා. ඔහුගේ උපකරණ මට පාවිච්චි කරන්න ඉඩ දුන්නා. ඒකෙන් නිකන්ම වගේ මමත් චිත්‍රකතා අඳින්න පුළුවන් ආධුනිකයෙක් වුණා. ඒ කාලේ චිත්‍ර කතා පත්තරවල ආධුනික චිත්‍රකතා ශිල්පීන්ට අවස්ථාවක් දුන්නා. ලීලාරත්න මහතා මට කැමිලස් කියන චිත්‍ර ශිල්පියා හඳුන්වාදීමෙන් මට ඒ අවස්ථාව ලැබුණා. එතනින් තමයි මම චිත්‍ර කතා ලෝකයට පය තිබ්බේ.

**විද්‍යා අධ්‍යාපනයට මොකද වුණේ?**
මට ලොකු විශ්වාසයක් තිබුණා උසස් පෙළ හොඳට සමත් වෙනවා කියලා. පළවෙනි සැරේ විශ්-වවිද්‍යාලයට යන්න ලකුණු කීපයක් මදිවුණා. දෙවෙනි සැරේ විභාගයට සූදානම් වෙනකොට මම ආධුනික චිත්‍රකතා ශිල්පියෙක් විදිහට චිත්‍ර කතා අඳින කාලේ. මට අහම්බෙන් ''සුහද'' කියන පත්තරේට දිග චිත්‍ර කතාවක් අඳින්න අවස්ථාවක් ලැබුණා. මම ගෙදරටත් නොකියා ඒ වැඩේ බාරගත්තා. පොඩි වැටුපකුත් ලැබුණා. එතනින් පස්සේ විභාගෙ කිරීම අත්හැරියා.විද්‍යා අධ්‍යාපනය අවසන් වුණා. ඊට පස්සේ ටිකෙන් ටික මට අවස්ථාවන් ලැබුණා වැඩි වැටුප්වලට ලොකු ආයතනවලට චිත්‍ර ශිල්පියෙක් විදිහට සම්බන්ධ වෙන්න.

**පසු කාලයකදී ඔබට චිත්‍ර ශිල්පය සම්බන්ධයෙන් විධිමත් අධ්‍යාපනයක් ලබාගන්න අවස්ථාවක් ලැබ-ණාද?**
කියන්න කණගාටුයි. එහෙම අවස්ථාවක් නම් ලැබ-ණේ නෑ. වෙන ශිල්පීන්ට වගේ ගුරුවරුන් හිටියෙත් නෑ. රැකියාවම තමයි අධ්‍යාපනය වුණේ. චිත්‍ර කතා අඳිද්දී අපි වෙනත් චිත්‍රකතා ඇඳලා තියන හැටි බලනවා. පිටරට සඟරාවල චිත්‍ර බලනවා. අඳිනවා. ගොඩාක් වරදිනවා. ඒවා පලවුණාට පස්සේ වැරදියි, කැතයි කියලා හිතෙනවා. ලැජ්ජාව ඇතිවෙනවා. එහෙම කරලා කරලා තමයි අත හුරුවීම ඇතිවුණේ. අවුරුදු තිස් හතරක් තිස්සේ ඔය විදිහට ඇඳලා ඇඳලා තමයි චිත්‍ර කතාවලට පමණක් නෙවෙයි පේන්ටින්ග්ස්, රේඛා චිත්‍ර වගේ ඔය හැම එකක්ම අඳින්න පුහුණුව ලැබුණේ.
ඔය අතරේ මම ටික කාලයක් චිත්‍ර කතාවලින් ඉවත්වෙලා වෙළඳ ප්‍රචාරණ ආයතනවලට ගියා. වෙළඳ ප්‍රචාරණ චිත්‍ර කලාව චිත්‍රකතා කලාවට වඩා ගොඩක් වෙනස්. ඒවාට අවශ්‍ය පහසුකම් ලැබෙනවා. එහි හිටපු අනෙක් ශිල්පීන්ගෙන් යම් යම් දේවල් ඉගෙන ගන්න ලැබුණා. ඔය විදිහට ඒකත් අධ්‍යාපන ඇකඩමියක් වුණා. දැනුත් අලුත් දෙයක් දැක්කාම ඒ විදිහට ඉගෙන ගන්නවා. ගුරුවරු නැතිව.





**බොහෝ චිත්‍ර ශිල්පීන්ගේ මෙන්ම ඔබගේ චිත්‍ර නිර්මාණවලත් ශිල්පියාටම විශේෂිත වූ අනන්‍යතාවක් දකින්නට ලැබෙනවා. චිත්‍රය දුටු පමණින් ''මේක අනුර ශ්‍රීනාත්ගේ චිත්‍රයක් වෙන්න ඕනේ'' කියන සිතිවිල්ලක් නරඹන්නාට ඇතිවෙනවා. ඔබේ චිත්‍ර බොහෝ විට රේඛා බහුල, එක්තරා ආකාරයකට කාටූන් ස්වාභාවයක් ගන්නවා. කොහොමද මේ අනන්‍යතාව ඇති කර ගත්තේ?**
මට කියන්න තේරෙන්නේ නෑ ඒක කොහොමද වුණේ කියලා. නමුත් ඒක හැම ශිල්පියෙකුටම වගේ පිහිටලා තියන දෙයක්. ලෝකේ කොතන හිටියත් ඉරක් ඇදීමෙන් පවා ඒක ඇන්ද චිත්‍ර ශිල්පියා හඳුනාගත හැකි වෙන ආකාරයක් තියනවා. මුලින්ම අපි එක් එක් චිත්‍ර ශිල්පීන්ගේ චිත්‍ර බලාගෙන අඳිනවා. එහෙම කරගෙන යන අතරේ අපේම එකක් හදාගන්න උත්සාහ කරනවා. කාලයක් තිස්සේ මහන්සි වුණාම ඒ විදිහේ අනන්‍යතාවයක් හැදෙනවා. මගේ ශෛලියත් ඒ වගේ. නමුත් මම මගේ ශෛලියත් කාලෙන් කාලෙට ටිකෙන් ටික වෙනස් කරගන්නවා. මොකද ඒකාකාරීවීම තුළින් ජනතාවට එපා විය හැකි නිසා.

**ඔබේ චිත්‍ර කතාවල අනන්‍යතාව, කතාව ඇතුළේ ගැඹුරු දේශපාලන කතාවක්, ඇතුළාන්තයක් තිබීමයි. කොහොමද මේ දේශපාලන ගැඹුර නිර්මාණවලට ලැබෙන්නේ?**
මම තෝරාගත්ත දේශපාලනයක් තියනවා. මම වාමාංශිකයෙක්. සමාජවාදියෙක්. තරුණ කාලේ ඉදළම මම ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෙක් විදිහට ඒ දේශපාලනය තෝරාගත්ත කෙනෙක්. ජනතා විමුක්ති පෙරමුණ නිදහස ලබලා එළියට එන-කොට මට වයස අවුරුදු විස්සක් විතර ඇති. ඒ වෙලාවේ හොයාගෙන ගිහිල්ලා මම ඒ දේශපාලනයට සම්බන්ධ වුණා. මගේ බලාපොරොත්තුව මේ රට සමාජවාදී රටක් කරගැනීමයි. සිංහල දෙමළ මුස්ලිම් බර්ගර් කියලා වෙනසක් නැතුව කාටත් සමානව ජීවත්වෙන්න පුළුවන් රටක් කරගැනීමයි. මගේ ආගම බුද්ධාගම. බුදු දහමේ කතා කරලා තියෙන්නෙත් සමානාත්මතාවය ගැන. රටේ හැමතැනම බුදු පිළිම තිබුණත් බුදු දහමේ කියවෙන සාරාර්ථ තමයි රටේ නැත්තේ. සමාජවාදයේ කියන්නෙත් අපි ජීවත්වන කෙටි කාලේ සන්තෝෂෙන් ජීවත්වෙන්න ඕනේ. හැමෝටම හැමදේම තියෙන්න ඕනේ කියලා. ඒ වෙනුවෙන් කලාකාරයකුට කරන්න පුළුවන් දේ මගේ නිර්මාණ මගින් උපරිමයෙන් කරන්න මම උත්සාහ කරනවා.

**කලා නිර්මාණ තුළින් සමාජය ගැඹුරු දේශපාලන කථිකාවකට යොමු කළ හැකියි, සමාජයේ දේශපාලන වෙනසක් ඇති කළ හැකියි කියලා ඔබ හිතනවාද?**
මට සමාජය වෙනස් කරන්න බෑ. නමුත් රුසියාව, චීනය, වියට්නාමය, කියුබාව වගේ රටවල හිටිය කලාකාරයෝ තමන්ගේ රටේ මිනිස්සුන්ගේ මනස හදන්න කලා නිර්මාණ කළා. එහෙම වුණාම තමයි රටක් වෙනස් කළ යුතුයි කියන කාරණය ජනතාව තේරුම් ගන්නේ. යථාර්ථය දැනගන්න කලාකාරයන් ජනතාවට උදව් කරන්න ඕනේ. එහෙම කලාක-ාරයෙක් තමයි මම. මම බොහොම පුංචි කලාක-ාරයෙක්. මට තියන පිළිගැනීම බොහොම පුංචි එකක්. නමුත් මගේ යුතුකම කියලා හිතෙන දේ තමයි මම ඉටුකරන්නේ. ඒක හරියි කියලා තවත් කලාකාරයෙක් මගේ නිර්මාණ හරහා කලාවට යෙ-ාමුවෙනවා නම් ඒකත් මගේ ජයග්‍රහණයක්. නමුත් කලාකාරයන්ට විතරක් බෑ සමාජය හදන්න. එයට අනෙක් හැම ක්ෂේත්‍රයකම අය එකතුවිය යුතුයි. සමහර කෙනෙක් මගේ අදහස පිළිනොගන්න පුළුවන්. කොහොම වුණත් මගේ නිර්මාණ හොඳනම් ඒකාකාරී නොවෙයි නම් මම බය නැතිව අදහස් ප්‍රකාශ කරනවා නම් ඒ තමයි මම දේශපාලනයෙන් ලබාගත්ත පන්නරය. ඒ ගැන මම ආඩම්බර වෙනවා.

සංවාද සටහන සහ ඡායාරූප
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

**ඔබේ දේශපාලනික ඇතුළාන්තයක් සහිත නිර්මාණ සම්බන්ධයෙන් ලැබෙන පාඨක ප්‍රතිචාර මොනවගේද?**
මගේ නිර්මාණවලට කැමතිවෙලා තියෙන්නේ

රටවල් 40ක සිට ශ්‍රී ලාංකිකයන් අසන ගුවන්විදුලිය - තිසර www.thisara.com